රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 39/2019(I)

මගේ අංකය: ES/1/චක්‍රලේඛ
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.11.03

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2138/27 හා 2019.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2019.12.31 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 39/2019 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛයෙහි 2.1 (ආ) වගන්තියට පසුව පහත සඳහන් සටහන ඇතුළත් කරනු ලැබේ.

"**සටහන :** ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය හෝ 2019.02.26 යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කරනු ලැබේ."

03. එසේම 2.2 (අ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"**2.2 (අ)** II ශ්‍රේණියේ වසර දෙක (02)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව III සහ II ශ්‍රේණිවල වසර දොළහක (12) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහක් (11) උපයාගෙන තිබීම."

04. මෙම චක්‍රලේඛය මගින් සංශෝධිත විධිවිධාන හැර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 39/2019හි සඳහන් අනෙකුත් කොන්දේසි හා විධිවිධාන තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

05. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය අනුව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය